

# තේරවිලි තෝරමු

ඊ.ඒ.ජී. තනුලි නිමංසා අතාවුද

# තේරවිලි තෝරමු

ඊ.ඒ.පී. තනුලි නිමංසා අතාවුද
කතෘ

කතෘගේ වෙනත් කෘති

මලී
වැස්ස දවසක්
මගේ උපන් දිනය

මහාමායා බාලිකා විද්‍යාලය
මහනුවර
5 වසර A

2026.05.01

ISBN 978-624-211-103-2

# පිදුම

අකුරින් අකුර ගලපන්න

මා හට කියා දුන් ....

ආදරණීය මගේ ගුරු මෑණිවරුන්ටත්

මා ලියපු පොතේ වචන පේළි

නිවැරදි කර දී ....

සෙවනැල්ලක් මෙන් ළඟ හිඳිමින්

මා දිරිගැන්වූ ආදරණීය

මගේ අම්මාටත්, අප්පච්චිටත් .....

අත්තම්මා සහ අයියාටත්

ආදරයෙන් පිළිගන්වමි...



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව<br>
2026.05.10


මනස සුවපත් කරන විඩාව නැති කරන අංගයක් විදිහට තේරවිලි හඳුන්වා දිය හැක. අතීතයේ ග්‍රාමීය මුතුන් මිත්තන් විසින් ඔවුන්ගේ සතුට විනෝදය හා මහන්සිය නිවා ගැනීමට භාවිතා කරන ලද එක්තරා සන්නිවේදන ක්‍රමයක් ලෙසට ද අපට මෙය හඳුන්වා ගන්න පුළුවන් බාල, තරුණ, මහලු කාට වුවද කිසිම භේදයකින් තොරව විනෝදය හා දැනුම ලබා දෙන තේරවිලි වලට ඇත්තේ දිගු ඉතිහාසයකි.

අපේ මුතුන් මිත්තන් දවසේ වැඩ කටයුතු අවසන් කර සැන්දෑවේ අම්බලමක, හේනේ පැලක හෝ රාත්‍රි ආහාරය පිසීමෙන් පසුව ගෙදර අඹු දරුවෝ, අසල් වැසියන් සමග එකතු වී සතුටු සාමීචියේ යෙදෙමින් තමන්ගේ ජීවිතයේ තනිකම විඩාව නිවා ගැනීමට පුරුදු වෙලා සිටියහ. මේ ආකාරයට අද කාලයේ වගේ කාර්ය බහුල තරගකාරී ජීවන රටාවෙන් මිදිලා සැහැල්ලුවෙන් ජීවත් වෙද්දි අපේ මුතුන් මිත්තන් විනෝදාස්වාදය ලැබුවේ මේ අන්දමේ තේරවිලි විසඳීමෙන්, ජනකවි හා පැල්කවි ආදිය කියමින් ය. තේරවිලි වල තිබුණු වදන් වල අර්ථය සෙවීමට යාමෙන් ඔවුන්ට විනෝදාස්වාදය ට එහා ගිය තාර්කික බුද්ධියක් ද ලැබුණු නිසා තේරවිලි විසඳීම පැරැන්නන්ගේ විනෝදාංශ අතර ජනප්‍රියම විනෝදාංශයක් බවට පත් විය.

අර්ථය සඟවා ප්‍රහේලිකාවක ආකාරයෙන් යමක් ඉදිරිපත් කිරීම තේරවිල්ලක් යැයි කිවහොත් එය නිවැරදි අරුත් ගැන්වීමක් විය හැක. තේරවිලි වර්ග කිහිපයක් තිබේ. සරල තේරවිලි, තුන් තේරවිලි, පද පෙරළි, තේරවිලි කවි වශයෙනි. සරල තේරවිලි තෝරා පිළිතුරු සොයා ගැනීම පහසු ය. තේරවිල්ලට හොඳින් සවන් දී පිළිතුරු ලබා දීම මෙහිදී සිදුවේ.

**01.** පිරිසිදු කලාම කළු පාටයි

**- කළු ලෑල්ල**




**02.** සුදු මහත්තයා කළු තොප්පියක් දාගෙන

**- ගිනි කූර**



**03.** කන්න දෙනකොට ජීවත් වෙනවා
වතුර දෙනකොට මැරෙනවා

**- ගින්දර**




**04.** කැලේට පාන

**- හඳ පාන**

**05.** ගෙදර ඉන්න කිඹුලගේ මල්ලි

**- හූනා**




**06.** පීනාන්න බැරි මාළු

**- ආනමාළු**



07. පියාසලයි ඉහළ නොයයි හිත රිදුනොත් මෙයා අඬයි

- ඇස




08. අතින් කටට.... කටින් බඩට.... බඩින් අතට... අතින් අතට.....

- ලියුම



09. වලලද්දී කොළ පාටයි ගොඩ ගද්දී කහ පාටයි

- කෙසෙල් කැන




10. ලේ කිව්වට රතුත් නෑ නා කිව්වට දළුත් නෑ

- ලේනා




11. ගහක් උඩින් මුවෙක් පැන්නා

- කෙසෙල් මුව




12. ඉස්පිලි පහක්ම නමට යෙදෙන සතා

- ගිනි කිකිළි



13. නෙත් දොළහයි මුහුණ වටයි
අත් දෙකකුත් මුහුණේ නටයි

- ඔරලෝසුව





14. එක කකුලයි උඩින් ගමන් යයි

- කුඩය




15. කකුල් හතරක්ම ඇත. ඒත් ගමන් නම් නැහැ

- පුටුව



16. සුදු මහත්තයා හොටු පෙරාගෙන

- ඉටි පන්දම



17. බොන්නෙත් නෑ කන්නෙත් නෑ
ගෙදර දොරේ නිතරම බුදි

**- දොරේ ඉබ්බා**




18. ඇඳුම් 100 ක් ගැලෙව්වත් බොත්තම් නෑ

**- ගෝවා ගෙඩිය**


19. ටොකු ඇන ඇන නාවනවා

**- කොණ්ඩ කැවුම**




20. අත්තක් උඩ බුම්මාගෙන කටු රෙද්දක්
පෙරවාගෙන බඩේ පැටව් පුරවාගෙන

**- කොස් ගෙඩිය**




21. වත්ත වකයි වක දෙවකයි
වත්තක පොල් ඔක්කොම කයි

**- හිරමනය**



22. අම්මා නිදයි දුව පෙරළෙයි

**- මිරිස්ගල**



23. අතු අග පිපෙන ලිය

- අරලිය



24. ලෝකයේ ලොකුම ගින්න

- බඩගින්න

25. ඇගේ වදිනවා අල්ලන්න නම් බෑ

- සුළඟ

26. මුතු නැති බෙල්ලා

- ගොළුබෙල්ලා



27. නැට්ට නැති කොළය

- පත්තරය

28. කොළ නැති ගස

- මෝල් ගස



29. ගියොත් ආයෙත් නොඑයි

- වයස

30. දවල් කණා

- බකමූණා




31. කාන්තාරයේ නැව

- ඔටුවා


32. පලතුරකි ලෙඩකි නමට අකුරු තුනකි

- පැපොල්



33. මල්ලක දැගන්න බැරි රට

- බුරුමය



34. සාක්කුවෙන් පිටට පනී පස් දෙනෙක්ම බදා ගනී

- ලේන්සුව

35. කැපුවොත් හිරේ කෑවොත් බඩේ


- බෙලි

36. ගස් වල නැති මල

- කම්මල


37. උඩහ ගෙදර මම යන කොට
අඟර දඟර වැලක් තිබුණා
මල් සුවඳයි ගෙඩි තිත්තයි
නොතේරුවොත් ටොකු විස්සයි

- කරවිල



38. තපස් රකිනවා
කෙතේ ඉන්නවා
මාළු සොයනවා
කියන්න මගෙ නම

- කොකා




39. ගුලක් බලා රිංගනවා
ඒක ඇතුළෙ කැරකෙනවා
ගේ දොර බඩු රැකදෙනවා
තේරුවොතින් පඬි වෙනවා

- යතුර




40. පිරිසිදුකම කරන අගේ
රැවුල ඉත්තෑ කූරු වගේ
මිදුල වටේ යන එන කොට
රැවුල ඇදෙයි පොළාව දිගේ

- ඉදල



41. උඩිනුත් ගින්දර යටිනුත් ගින්දර මැද්දේ
සවුන්දර කන්නේ පාන්දර

- ආප්ප



42. ඉරටු ඇගේ කොළ අලවා
රැලි දමලා හැඩ කරලා
දිග නූලක ගැට ගසලා
යවයි අහසෙ පා කරලා


- සරුංගලය



43. දික් දිගට කොළ ඇතේ
ඇඟ පුරුක් මෙන් ඇතේ
හපන විට පැණි ඇතේ
තෝරන්න පොඩි පුතේ

- උක්

44. ගේ අරගෙන ඇවිදින්නේ
දවල්ට මම හැංගෙන්නේ
එළවළු දලු කොළ කන්නේ
ගොවියගෙ හතුරෙක් වන්නේ



- ගොළුබෙල්ලා

45. බුදු කුස්සිය
බුදු නම් මුනි
කුස්සිය නම් පැළ
මුනි පැල
පැණි මුල

46. ගව පළුව
ගව නම් ගොං
පළුව නම් අඩ
ගොං අඩ
අංගොඩ

47. කෝටු ඉලක්කය
කෝටු නම් දර
ඉලක්කය නම් මාන
දර මාන
මරදාන

48. ටිකක් කැලය
ටිකක් නම් මද
කැලය නම් වල
මද වල
වද මල

49. පලයං බස් එක පතහට
පලයං නම් පෝ
බස් එක නම් රිය
පතහ නම් වළ
පෝරිය වළ
වාරියපොළ

50. ගජ නාලය
ගජ නම් ඇත්
නාලය නම් බටය
ඇත් බටය
බත් ඇටය

51. හෙණ දළ
හෙන නම් අකුණු
දළ නම් දත
අකුණු දත
දකුණු අත

52. කෙලවර හප හපා
කෙලවර නම් කොණ
හප හපා නම් කකා
කොණ කකා
කණ කොකා

53. වන්දි මුදල
වන්දි නම් දඩ
මුදල නම් කාසි
දඩකාසි
කඩදාසි

54. රත්තරන් වට
රත්තරන් නම් රන්
වට නම් ගෝල
රන් ගෝල
ගොන්රාල

55. ගොහුරු වේල්ල
ගොහුරු නම් මඩ
වේල්ල නම් කණ්ඩිය
මඩ කණ්ඩිය
කඩමණ්ඩිය

56. වෛරි පත්‍රය
වෛරි නම් මත්
පත්‍රය නම් කොළේ
මත් කොළය
කොත්මලය

57. වස මැසි
වස නම් වහ
මැසි නම් මැස්ස
වහ මැස්ස
මහ වැස්ස

58. තියුණු යහන
තියුණු නම් උල්
යහන නම් සයන
උල් සයන
සල් උයන

59. පිළිකුල් කකුල්
පිළිකුල් නම් ජරා
කකුල් නම් පය
ජරා පය
පරාජය


60. දික් නැති කොළය
දික් නැති නම් කොට
කොළය නම් පිටුව
කොට පිටුව
පිටකොටුව

61. ගසට නමකි ගස මැරුනම වෙන නමකි
ගෙඩියට නමකි ගෙඩියේ පොත්තට නමකි
මදයට නමකි මද කනකොට වෙන නමකි
මෙතුන් පදේ තෝරාලා කියන් සකි

ගස නම් ගොයම් ගස මැරුණම පිදුරු සකි
ගෙඩිය වී ඇටය ලොත්තට දහයිනා කි
මදයේ සහල් බත් වූ විට හොඳ රසකි
මෙතුන් පදේ මා කීවා හරිද සකි

62. හිසේ මල් පිපී බඩ දරුවන් වෙනවා
බඩේ ඉඳිද්දිත් දරුවෝ ලොකු වෙනවා
උකුළට වඩන කොට දැළි රැවුලත් එනවා
මේ සත්තේ තේරූ අය පඬි වෙනවා

කහ මැද කරල මල ඉහළින් පිපෙන්නේ
ඇට කිරි වැදි කොපු ඇතුලත මෝරන්නේ
පිපිමල් රේණු වේලි රැවලක් වන්නේ
බඩ ඉරිඟුයි මෙම කවියෙන් කියන්නේ



63. ටිං ටිං ගාන්නා තෝරා එවාපන්
ටං ටං ගාන්නා තෝරා එවාපන්
මග වැලි පිසින්නා තෝරා එවාපන්
දෙගම්බඩ රජා තෝරා එවාපන්

ටිං ටිං ගාන්නා ලේනා නොවේ දෝ
ටං ටං ගාන්නා ගෝනා නොවේ දෝ
මග වැලි පිසින්නා කුකුළා නොවේ දෝ
දෙගම්බඩ රජා කිඹුලා නොවේ දෝ

64. ඉණේ තිබෙන ලිය තෝරා එවාපන්
ගෙදර තිබෙන ලිය තෝරා එවාපන්
ගසේ තිබෙන ලිය තෝරා එවාපන්
අතු අග තිබෙන ලිය තෝරා එවාපන්

ඉණේ තිබෙන ලිය හැඹිලිය නොවේ දෝ
ගෙදර තිබෙන ලිය ඇතිළිය නොවේ දෝ
ගසේ තිබෙන ලිය හෙරලිය නොවේ දෝ
අතු අග තිබෙන ලිය අරලිය නොවේ දෝ

65. සත් සමුදුරේ දිය පල්ලේ උපන්නේ
එම සමුදුරේ දිය මතුපිට පිපෙන්නේ
වැස්සට ලිනි බබා නිතර ම මෝරන්නේ
අද බැරි නම් හෙට තෝරා එවන්නේ

සත් සමුදුරේ දිය පල්ලේ තිබෙයි අල
එම සමුදුරේ දිය මතුපිට තිබෙයි කොළ
වැස්සට පිනි බබා මෝරන කැකුළු මල
මස්ටකයින්ට මුතු කුඩයකි නෙලුම් මල

## පද පෙරළි

| | | | |
|---|---|---|---|
| 66. | මච්ච පිල | - | පිච්ච මල |
| 67. | ගීසිරිය | - | සීගිරිය |
| 68. | නෙන්මීරිය | - | මින්නේරිය |
| 69. | කම්බලඋඩ | - | උම්බලකඩ |
| 70. | මත්තකොල්ලි | - | කොත්තමල්ලි |
| 71. | මාර පෙල | - | පේර මල |
| 72. | බොම්සාලය | - | සම්බෝලය |
| 73. | ගෙල් පොඩිය | - | පොල් ගෙඩිය |
| 74. | වීරමල | - | මාරවිල |
| 75. | දැකුළුමල් | - | මකුළුදැල් |
| 76. | මල්ආරිය | - | අල්මාරිය |
| 77. | පේච්චිකොට්ටිය | - | කෝච්චිපෙට්ටිය |
| 78. | වත්තල පිංගෙඩිය | - | පිත්තල වංගෙඩිය |
| 79. | මද වල | - | වද මල |



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වු වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.
මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN 978-624-211-103-2